# තායිවාන් සමාධිගම ජනතා අයිතියට පැවරීම



# PEOPLISATION OF TAIWAN SAMADHIGAMA

## Ambalantota

**10th Sept. 2005**

*A Home is Not Just a Shelter: It's an Opportunity for a Better Living*



ගාල්ල, හබරාදූව, අහංගම, වැලිගම, හම්බන්තොට ප්‍රදේශවල පවුල් 3000 ජනතාව වෙනුවෙන් ඉතාමත් පිළිවෙළකට වෙහෙස මහන්සියෙන් ගෙනෙන ලද බෙහෙත් ඇතුළු බඩු බාහිරාදිය බෙදා දීමට ලැබීම කාගේත් සිතට සැනසිල්ලක් වන අතර හම්බන්තොට බඩු බෙදාදීමේදී ඒ කටයුතු බෙහෙවින් ක්‍රමානුකූලව සිදු කිරීමේ කාර්යයට මුල්වී ක්‍රියාකළේ හාතාගල පුරාණ රාජමහා විහාරාධිපති පූජ්‍ය පල්ලේගම ජිනරතන නායක හාමුදුරුවන්ගේ මැදිහත් වීමෙනි. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමාපදනමත්, තායිවානයේ ථේරවාදී සමාධි පදනමත්, සුනාමි ව්‍යසනය නිසා පීඩිතයින් වෙනුවෙන් මූලික කටයුතු මෙසේ සිදු කළ අතර ඊළඟ පියවර තැබුවේ මේ ජනතාවට ස්ථිර ජීවන වැඩපිළිවෙළක් සකස් කර දීමටයි. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මඟපෙන්වීම අනුව හම්බන්තොට උහපිටිගොඩ ඉඩමක් වෙන් කළ අතර එම ඉඩම ලබාගැනීමේදී ජලසම්පාදන උප ඇමති ගරු මහින්ද අමරවීර මැතිතුමාගේ සහයෝගය අපට ලබාදෙන ලදී. තායිවාන් සමාධිගම නමින් ගෙවල් 1000 ව්‍යාපෘතියකි. පළමුවන අදියර වන සමාධිගම ගෙවල් 300 වැඩසටහන උහපිටිගොඩින් ආරම්භ කිරීමට 2005 පෙබරවාරි 18 දින අගමැති තුමා හා මහින්ද අමරවීර ඇමතිතුමා ඇතුළු මැතිඇමතිවරුන්ගේ මූලිකත්වයෙන් කටයුතු සැලසුණි.



උහපිටිගොඩ සමාධිගමේ වැඩකටයුතු සොයා බැලීමට හාතාගල පුරාණ විහාරාධිපති පූජ්‍ය පල්ලේගම ජිනරතන නායක හිමියන් බාරගත් අතර උන් වහන්සේට දිසාපති, උපදිසාපති ප්‍රාදේශීය ලේකම් තුමන්ලා සහ ග්‍රාමනිලධාරී මහත්වරුන්ගේ සහයෝගය නොමදව ලබාදෙන ලදී.

සුචිත් මොහොට්ටි මැතිතුමාගේ අධීක්ෂණය යටතේ සුචිත් මොහොට්ටි ආයතනය සියලු ගෘහ නිර්මාණ කටයුතු සිදුකළ අතර ගෙවල් සෑදීමට ඉදිකිරීම් ආයතන 6 කට බාරදෙන ලද අතර ඔවුන් තමන්ගේ කාර්යයක් ලෙසට ඉටුකිරීමට උත්සුක වීම අප මහත් සැනසීමකි.



මහා විපත්තිකර අවස්ථාවේදී ඉදිරිපත් වී ජනතාවට සේවා සැලසීමේදී අපට විශේෂයෙන්ම සහයෝගය ලබා දුන් ශ්‍රී ලංකා ධර්ම චක්‍ර පදනමේ කාර්ය මණ්ඩලයත්, තායිවානයේ ථේරවාදී සමාධි අධ්‍යාපන පදනමේ සභාපති තුමා ඇතුළු සියලුම සාමාජික සාමාජිකාවන්, තායිවාන් දහම් බෙරගිර සංගමයේ සියලුම සාමාජික භවතුන්, ජගත් සුමතිපාල මැතිතුමා ප්‍රධාන සුමති සමූහ ව්‍යාපාරය මේ අවස්ථාවේදී විශේෂයෙන් සිහිපත් කළ යුතුයි. අපත් සමග විශේෂයෙන්ම දහම් බෙරගිර සංගමය එකට එකතුව දීර්ඝ කාලීනව කටයුතු කිරීමට ලැබීමත් අපේ භාග්‍යයකි.

ආචාර්ය බෝදගම චන්දිම නාහිමි



**ගිසට සෙවණක්, ගිතට නිවනක් - ඔබට යහපත් දිවියක්**
**එයම අපට සතුටක් - වනු මැන ඔබ, ඔබට පහනක්**

## තායිවාන් සමාධිගම උහපිටිගොඩ - අම්බලන්තොට

තායිවානයේ ප්‍රධාන සංඝනායක ආචාර්ය බෝදගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි සුනාමි ව්‍යසනයට පත් පවුල් සඳහා ගොඩනගන නිවාස දහසේ ප්‍රථම අදියරේ නිවාස 300 දෙස් විදෙස් ගිහි පැවිදි සම්භාවනීය පිරිසකගේ සහභාගිත්වයෙන් 2005 සැප්තැම්බර් 10 වන සෙනසුරාදා පෙ. ව. 10.00 ට අම්බලන්තොට උහපිටිගොඩ තායිවාන් සමාධිගම ජනතා අයිතියට පවරාදීම නාගරික සංවර්ධන හා ජලසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරේ.

නිවාසලාභීන් සඳහා ගෘහ උපකරණ හා මුළුතැන්ගෙයි උපකරණ මෙදිනම පරිත්‍යාග කෙරේ. දකුණු සිරිලක දැනට ඉදිවන විශාලතම නිවාස ව්‍යාපෘතිය වන මෙය 'තායිවාන් සමාධිගම' විවෘත කිරීමේ ඓතිහාසික අවස්ථාව නිමිත්තෙනි.

